# කැලණිය විශ්වවිද්‍යාලය
# උපදේශන ඩිප්ලෝමාව

## අයදුම්පත් කැඳවීම - 2026 (නවවන කණ්ඩායම)

කැලණිය විශ්වවිද්‍යාලයේ, සමාජීයවිද්‍යා පීඨයේ, දර්ශන අධ්‍යයන අංශයේ, මනෝවිද්‍යා අධ්‍යයන ඒකකය මගින් පවත්වනු ලබන උපදේශන ඩිප්ලෝමාව සඳහා අයදුම්පත් 2025 සැප්තැම්බර් 21 වන දින සිට කැඳවනු ලැබේ.

**පාඨමාලා කාලය** : මාස 12 කි.

**මාධ්‍යය** : සිංහල

**පාඨමාලා ගාස්තු** : 63,250.00 (වාරික දෙකකින් ගෙවිය හැකිය)

**අයදුම් කිරීම සඳහා සුදුසුකම්** : අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සමත් වීම

**ලියාපදිංචි කිරීම සඳහා සුදුසුකම්** : සම්මුඛ පරීක්ෂණයෙන් සමත් වීම. ඩිප්ලෝමාව සඳහා තෝරා ගැනීමේ අවසාන තීරණය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සතු වේ.

**දේශන පැවැත්වීම** : සෙනසුරාදා හා ඉරිදා පෙ.ව. 9.00 - ප.ව. 4.00 (එක් දිනයක් තෝරා ගත යුතුය). මාසයකට දින 03 ක් මාර්ගගත ව (Online) ද එක් දිනයක් විශ්වවිද්‍යාලය තුළ (Physical) ද දේශන පැවැත්වේ.

**අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය : 2025. 10. 21**

### අයදුම්පත් ලබා ගැනීම :

www.kln.ac.lk වෙබ් ලිපිනයේ Academic/ Social Sciences/ Departments/ Philosophy වෙබ් පිටුවට පැමිණ අයදුම්පත බාගත කිරීම හෝ **0789962242** යන අංකයට වට්ස්ඇප් පණිවිඩයක් එවීමෙන් ලබා ගත හැකිය.

### අයදුම් කිරීම :

මහජන බැංකුවේ අංක 055-1-00110667549 දරණ ගිණුමට රු.750.00 ක මුදලක් බැර කළ යුතු ය. එම මුදල තැන්පත්කරන ලදු පතෙහි **හේතුව** යන තීරුවේ **DCOU** ලෙස යෙදීම අනිවාර්ය වේ. එම ලදුපත සමඟ අයදුම්පත **"උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව-2026, මනෝවිද්‍යා අධ්‍යයන ඒකකය, දර්ශන අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය"** යන ලිපිනයට 2025 ඔක්තෝම්බර් 21 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මනෝවිද්‍යා අධ්‍යයන ඒකකයට ගෙනැවිත් භාරදීම හෝ කළ යුතුය.

| පාඨමාලා අන්තර්ගතය | |
|---|---|
| **පළමු කොටස** | **දෙවන කොටස** |
| 1. සාමාන්‍ය මනෝවිද්‍යාව | 5. උපදේශනය හැඳින්වීම |
| 2. ළමා මනෝවිද්‍යාව | 6. උපදේශනය පිළිබඳ න්‍යායාත්මක එළඹුම් හා ක්‍රමශිල්ප |
| 3. සංවර්ධන මනෝවිද්‍යාව | 7. උපදේශන කුසලතා හා නිපුණතා |
| 4. අසාමාන්‍ය මනෝවිද්‍යාව | 8. පාසැල් උපදේශනය |

විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සහ සායනික මනෝවිද්‍යාඥවරුන් විසින් දේශන පවත්වනු ලැබේ. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි සායනික මනෝවිද්‍යාඥවරුන් විසින් උපදේශන කුසලතා පුහුණුව ලබා දෙනු ලැබේ.

දුරකතන අංකය : 0112 903847
මනෝවිද්‍යා අධ්‍යයන ඒකකය

ලේඛකාධිකාරි
කැලණිය විශ්වවිද්‍යාලය

tamilguru.lk